ශ්‍රී ලංකා නිදහස් නීතිඥ සංගමය
SRI LANKA FREEDOM LAWYERS' ASSOCIATION

2026 ජුනි මස 07 වන දින

## මාධ්‍ය නිවේදනය.

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් අභියාචනාධිකරණ හා ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස ඉහළ නැංවීමේ උත්සාහය සම්බන්ධයෙනි.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 (5) ව්‍යවස්ථාවේ දක්වා ඇති අභියාචනාධිකරණ හා ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස පිළිවෙළින් අවුරුදු 63 සහ 65 යන යන සීමාව ව්‍යවස්ථා සංශෝධනයක් මගින් තවත් වසර දෙක් බැගින් දීර්ඝ කිරීමට ආණ්ඩුව ගන්නා උත්සාහය පිළිබඳව ශ්‍රී ලංකා නිදහස් නීතිඥ සංවිධානය දැඩිව අවධානය යොමු කර සිටී.

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මගින් නිශ්චිතව වයස් සීමාවක් දක්වා ඇත්තේ ව්‍යවස්ථානුකූල පදනමකින් බව අපි අවධාරණය කරමු. එකී සීමාවන් ප්‍රබල සහ යුක්ති සහගත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පදනමකින් තොරව විධායකය හෝ ව්‍යවස්ථාදායකය විසින් සංශෝධනය කිරීම අධිකරණයේ ස්වාධීනත්වය හා අපක්ෂපාතීත්තවය සම්බන්ධයෙන් මහජන විශ්වාසය කඩවීමට හේතුවන බව අවධාරණය කරමු. අධිකරණ ක්ෂේත්‍රයේ හෝ රටේ වෙනත් ඕනෑම රාජ්‍ය හෝ පෞද්ගලික ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන් විශ්‍රාම වයස තීරණය කිරීම දත්ත හා සංඛ්‍යාලේඛන මත පදනම්වූ ජාතික ප්‍රතිපත්තියක් මත පිහිටා සිදුකළ යුතුය.

අද වන විටත් ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ විනිසුරුවරුන් 08 දෙනෙකුගේ පුරප්පාඩු පවතින අතර මෙම පුරප්පාඩු පිරවීම ජනාධිපතිවරයා විසින් දීර්ඝ කාලයක් තිස්සේ පැහැරහැර ඇත. තමා වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැවරී ඇති ව්‍යවස්ථාමය වගකීම පැහැර හැරීම එතුමාට එරෙහිව දෝශාභියෝග යෝජනාවක් ගෙන ඒමට පාදක කරගත හැකි බරපතල ව්‍යවස්ථාමය වගකීමක් පැහැර හැරීමකි. මේ වන විට ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ නඩු රාශියක් ගොඩගැසී ඇති අතර යුක්තිය පසිඳලීම සඳහා විශේෂයෙන් නඩු කටයුතු ඉක්මන් කිරීම සඳහා අධිකරණයන්ට යටිතල පහසුකම් සැපයීම පුළුල් කළ යුතුවා සේම විනිශ්චයකාරවරුන්ගේ පුරප්පාඩු පුරවා නඩු විභාග කිරීම් ඉක්මන් කළ යුතුය. මෙම ක්‍රියාමාර්ගයන් අමතක කර දමා ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ සේවා කාලය දිගු කිරීමෙන් නඩු ප්‍රමාද වීම වළක්වාලීමට නුපුළුවන. මෙසේ කළ යුතු දෑ තිබියදී මෙලෙස විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම ගන්නා කාල සීමාව දීර්ඝ කිරීමට කටයුතු කිරීම රජය යම් යටි අරමුණක් සහිතව කරනු ලබන ක්‍රියාවක් බවට බලවත් සැකයක් මතුවේ. මේ තුළින්ම අධිකරණයේ ස්වාධීනතාවය පිළිබඳව ප්‍රශ්නාර්ථයක් නැගීමට මෙම ක්රි>යාව තුඩුදෙනු ඇත.

යම් හෙයකින් එකී සංශෝධනය ක්‍රියාත්මක කළහොත් දැනට මහාධිකරණ දිසා අධිකරණ හා මහේස්ත්‍රාත් අධිකරණ ඇතුළු වෙනත් අධිකරණයන්හි සේවය කරන විනිශ්චයකාරතුමන්ලාට බරපතල වෘත්තීය අසාධාරණත්වයකට මුහුණ පෑමට සිදුවනු ඇත. එහෙයින් ඔවුන්ගේ සිත්වල ඇතිවිය හැකි බරපතල කඩාවැටීම අධිකරණයේ ස්වාධීනතාවයට මෙන්ම ගුණාත්මක අධිකරණ සේවයක් පවත්වාගෙන යාමට බලවත් අභියෝගයක් වන බවට අපගේ විශ්වාසයයි.

301, ටී. බී. ජයා මාවත, කොළඹ 10. www.slfp.lk E-mail: slfphqs@gmail.com Tel: 0112680126 / 2680127

සමස්ත අධිකරණ ක්ෂේත්‍රය තුළම විනිසුරුවරුන් හා විවිධ නිලධාරීන්ගේ පවතින මානව සම්පත් හිඟය නිසි පරිදි පිරවීමට කටයුතු කිරීමේ ප්‍රමුඛ අවශ්‍යතාවය මඟ හැර අධිකරණ පද්ධතියම අවුල් ජාලාවක් බවට පත්කරන අභියාචනාධිකරණ හා ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ අනිවාර්ය විශ්‍රාම වයස වැඩි කිරීමට ගෙන එන යෝජනාව සාකච්ඡාවට බඳුන් කිරීමකින් තොරවම ප්‍රතික්ෂේප කළ යුතු බව ශ්‍රී ලංකා නිදහස් නීතිඥ සංගමය දැඩිව අවධාරණය කරයි.

තව ද ශ්‍රී ලංකාවේ සමස්ත නීතිඥ ප්‍රජාව නියෝජනය කරන ශ්‍රී ලංකා නීතිඥ සංගමය ඇතුළු කොළඹ මහාඅධිකරණ නීතිඥ සංගමය, ෆ්‍රී ලෝයර්ස් සංවිධානය හා මෙරට වෘත්තීයවේදී සංවිධාන රාශියක් මෙම ක්‍රියාවලිය සඳහා සිය දැඩි විරෝධය පළකර ඇති බව පෙන්වා දෙනු කැමැත්තෙමු.

ප්‍රජාතන්ත්‍රවාදයත් නීතියේ ආධිපත්‍යයත් සුරැකීමට කැප වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරනු ලබන ශ්‍රී ලංකා නිදහස් නීතිඥ සංගමය අභියාචනාධිකරණ හා ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ අනිවාර්ය විශ්‍රාම වයස වැඩි කිරීමට ගෙන එන යෝජිත යෝජනාවට සිය බලවත් විරෝධය සහ අප්‍රසාදය පළකරන අතර එවන් යෝජනාවක් වේ නම් එය ඉවත් කර ගන්නා ලෙස රජයෙන් ඉල්ලා සිටී.

**නීතිඥ සංජය ගමගේ**
සභාපති
ශ්‍රී ලංකා නිදහස් නීතිඥ සංගමය වෙනුවෙන්

**නීතිඥ පියල් දර්ශන ගුරුගේ**
නියෝජ්‍ය ලේකම්